සියලු ම හිමිකම ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

14077
7 · 11 · 2016
Library

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) බහු පක්ෂ ක්‍රමයක් ඇති රටකට උදාහරණයකි.
(1) මහා බ්‍රිතාන්‍ය. (2) ඉන්දියාව.
(3) ඇමරිකා එක්සත් ජනපදය. (4) කියුබාව.

(02) නීති ක්‍රියාත්මක කරවන ආයතනය හඳුන්වන්නේ පහත කිනම් නමකින් ද?
(1) ව්‍යවස්ථාදායකය. (2) ආණ්ඩුව. (3) විධායකය. (4) අධිකරණය.

(03) එකම පාලන ව්‍යුහයක් තුළ විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරන පිරිස් ජීවත්වන සමාජයක් හැඳින්විය හැක්කේ,
(1) බහුවාර්ගික සමාජයක් ලෙස ය. (2) බහුජාතික සමාජයක් ලෙස ය.
(3) බහු ආගමික සමාජයක් ලෙස ය. (4) බහු සංස්කෘතික සමාජයක් ලෙස ය.

(04) සන්ධීය රාජ්‍ය ක්‍රමයක මූලික ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ පහත පිළිතුරු අතරින් කුමක් ද?
(1) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම.
(2) මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවයක් තිබීම.
(3) අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩු ක්‍රමය තුළ නොතිබීම.
(4) බලය විමධ්‍යගත කර තිබීම.

(05) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
(1) රාජ්‍ය සේවයට අයත් පරිපාලන නිලධාරීන්ය.
(2) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.
(3) ජනාධිපතිවරයා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.
(4) ඡන්දයෙන් තේරී පත්වන මහජන නියෝජිතයන් ය.

(06) ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයක් ලෙස සැලකිය හැක්කේ,
(1) වැදගත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා සම්මත කිරීමයි.
(2) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි.
(3) පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමයි.
(4) නීති අර්ථකථනය කිරීමයි.

(07) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීමේ බලය හිමි පුද්ගලයා වන්නේ,

(1) හමුදාපතිවරයා ය. (2) ආරක්ෂක ලේකම්වරයා ය.
(3) ජනාධිපතිවරයා ය. (4) අගමැතිවරයා ය.

(08) පොදු දේපළ අයිතිය රාජ්‍ය ව්‍යවසාය සතුවන සමාජවාදී අර්ථක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ කිනම් රටක ද?

(1) ඉන්දියාවේ ය. (2) කියුබාවේ ය. (3) ජපානයේ ය. (4) එංගලන්තයේ ය.

(09) අන්තර් භාණ්ඩයකට උදාහරණයකි.

(1) පොහොර (2) කිරිපිටි (3) යන්ත්‍ර සූත්‍ර (4) සීනි

(10) මිශ්‍ර අර්ථක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ,

(1) නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය සතුවීමයි.
(2) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී පොදු යහපත උදෙසා කටයුතු කිරීමයි.
(3) ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුකිරීමයි.
(4) මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය සැලසුම් කිරීමයි.

(11) රටක සියලු ම පුරවැසියන් එක්රැස් වී පාලන කටයුතු පිළිබඳව තීරණ ගැනීම හැඳින්විය හැක්කේ,

(1) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය. (2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.
(3) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය. (4) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ය.

(12) වායු දූෂණය වන කෘත්‍රිම ක්‍රමයකට උදාහරණයක් පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) ගිනි කඳු පිපිරීම (2) කර්මාන්තශාලාවලින් දුම් පිට කිරීම
(3) ලැව් ගිනි ඇතිවීම (4) දූවිලි කුණාටු ඇතිවීම

(13) වර්තමාන ඇමරිකා එක්සත් ජනපදය තුළ ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවා යමින් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඊට බලපෑ හේතුවක් වන්නේ,

(1) සමාජ, දේශපාලන, ආර්ථික ගැටලුවල සංකීර්ණ ස්වභාවයක් පැවතීම.
(2) රට තුළ දැඩි භූගෝලීය විෂමතාවයක් පැවතීම.
(3) වාර්ගික භාෂා ආගම් ප්‍රශ්න ඇතිවීම.
(4) මුල් ජනපද 13 බලවත් වීම.

(14) නිෂ්පාදන සාධක එකතුකර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මෙහෙයවීමේ කාර්යය කිනම් නමකින් හැඳින්විය හැකි ද?

(1) ශ්‍රමය (2) ප්‍රාග්ධනය (3) ව්‍යවසායකත්වය (4) නිෂ්පාදනය

(15) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා අත්වන වාසියක් නොවන්නේ,

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආණ්ඩුවට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට නොහැකිවීම.
(2) ආණ්ඩුක්‍රමයක ක්‍රමවත් බවක් ඇතිවීම.
(3) පුරවැසියන්ට සිය සිතුම් පැතුම් අවශ්‍යතා ආණ්ඩුක්‍රම ආයතන මගින් ඉටුකර ගැනීමේ හැකියාව ලැබීම.
(4) ආණ්ඩුක්‍රමයක ස්ථාවර බව ඇතිවීම.

(16) නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට බලපෑ ප්‍රධානම හේතුව වන්නේ,
(1) ජනතාවගේ බලවත් ඉල්ලීම.
(2) සම්පත් සංරක්ෂණය කිරීම.
(3) ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම.
(4) මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීම.

(17) සමාජයක පුද්ගලයින්ගේ පුද්ගලික සම්බන්ධතා පාලනය කරන සහ ඔවුන් අතර ඇති වැරදි සම්බන්ධයෙන් බලපාන නීතිය හඳුන්වන්නේ,
(1) උඩරට නීතියයි.
(2) සිවිල් නීතියයි
(3) අපරාධ නීතියයි
(4) දේශීය නීතියයි.

(18) ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයට අදාළ නීති සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒවා සම්මත කර ගැනීමේ කාර්යය මෙහෙයවන පුද්ගලයා කවුරුන් ද?
(1) අගවිනිසුරුතුමා ය.
(2) අධිකරණ ඇමතිතුමා ය.
(3) නීතිපතිතුමා ය.
(4) ජනාධිපතිතුමා ය.

(19) අවසාන අභියාචනාධිකරණ බලය හිමි අධිකරණය ආයතනය පහත පිළිතුරු අතුරින් තෝරන්න.
(1) මහේස්ත්‍රාත් අධිකරණයයි.
(2) අභියාචනාධිකරණයයි.
(3) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(4) මහාධිකරණයයි.

(20) පාර්ලිමේන්තුව සතු බලතල හා කාර්යයකි, විධායකය පාලනය කිරීම. ඒ සඳහා කළ හැකි කාර්යයකි.
(1) දෝෂාභියෝගයක් මගින් ජනාධිපතිවරයා ඉවත් කිරීම
(2) පනත් කෙටුම්පත් සම්මත කිරීම
(3) පනත් කෙටුම්පත් සංශෝධනය කිරීම
(4) අගමැති සහ අමාත්‍ය මණ්ඩලය පත් කිරීම

(21) ප්‍රථම කලාපීය යුධමය සංවිධානය වන්නේ,
(1) සාර්ක් (SAARC)
(2) උන්ක්ටාඩ් (UNCTAD)
(3) යුනිසෙෆ් (UNICEF)
(4) නේටෝ (NATO)

(22) පහත සඳහන් ප්‍රකාශ අතුරින් සංවර්ධනය මැනීම සඳහා භාවිත නූතන මිනුම් පමණක් අයත් නිවැරදි පිළිතුර තෝරන්න.
A - දළ ජාතික නිෂ්පාදිතය
B - මානව සංවර්ධන දර්ශකය
C - මානව පීඩක දර්ශකය
D - ආර්ථික වර්ධන වේගය
(1) A හා D (2) B හා C (3) A හා C (4) A හා B

(23) පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශ "ආ" තීරුවේ ප්‍රකාශ සමග නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. පරිසර සංරක්ෂණය | A. පාරිසරික සමතුලිතාවය |
| 2. පාරිසරික ගැටලු අවම කිරීම | B. අපේ පොදු අනාගතය |
| 3. තිරසාර සංවර්ධනය පිළිබඳ මූලික අදහස හඳුන්වාදීම | C. පරිසර අමාත්‍යාංශය |
| 4. පරිසරයට මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය අඩුකිරීම | D. ස්වභාවික වායු |
| | E. සිංහරාජ වනාන්තරය |

(1) EBCD (2) CABD (3) CBDA (4) DACD

(24) පුද්ගලයෙකුගේ මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමුවිය හැකි අංශයක් වනුයේ,
(1) වෙහෙස මහන්සිවී වැඩවල නිරත්වීම
(2) විවිධ මාධ්‍ය වැඩසටහන්වලට යොමුවීම
(3) ආගමික වතාවත් කෙරෙහි හිත යොමු කිරීම
(4) නිතර ක්‍රීඩා කටයුතුවල නිරත වීම

(25) අජෛව පරිසරය හෙවත් අජීවී පරිසරයට අයත් සංරචක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) වායුගෝලය, දේශගුණය, පස හා සාගර
(2) මිනිසා, සත්තු, ශාක හා වායුගෝලය
(3) මිහිතලය, මිනිසා, ශාක සහ පස
(4) දේශගුණය, පාෂාණ, ශාක හා සත්තු

(26) වෙළඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණය වන්නේ,
(1) නිෂ්පාදන ක්‍රියාවලියෙහි සෘණ බාහිරතා කෙරෙහි සැලකිලිමත්වීම ය.
(2) වෙළෙඳපොළ කටයුතුවලට රාජ්‍ය මැදිහත්වීම ය.
(3) ජනතාවගේ සුබසාධනය උදෙසා භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දීම ය.
(4) ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී ඉල්ලුම හා සැපයුම බලවේග මත ලැබෙන මිල අනුව තීරණ ගැනීමය.

(27) ශ්‍රී ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලැබුණේ පහත සඳහන් කිනම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයකින් ද?
(1) ක්‍රි.ව. 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය මගිනි.
(2) ක්‍රි.ව. 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(3) ක්‍රි.ව. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(4) ක්‍රි.ව. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.

(28) ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන මූලිකම ක්‍රමය වන්නේ,
(1) මැදිහත්කරණය
(2) සාකච්ඡාව
(3) සහමන්ත්‍රණය
(4) සමථකරණය

(29) සාක්ෂරතාව, උපතේදී ආයු කාලය හා ක්‍රය ශක්තිය පදනම් කරගෙන ගණනය කරනු ලබන දර්ශකය කුමක් ද?
(1) මානව සංවර්ධන දර්ශකය
(2) මානව දරිද්‍රතා දර්ශකය
(3) මානව පීඩක දර්ශකය
(4) භෞතික ජීවන තත්ත්ව දර්ශකය

(30) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවලට අයත් බලතල ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) රාජ්‍ය ආරක්ෂාව
(2) පළාත් පාලන කටයුතු
(3) ජාතික ප්‍රවාහනය
(4) විදේශ වෙළෙඳාම

(31) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා පත්කිරීමේ බලය ඇත්තේ පහත කවුරුන්හට ද?
(1) කථානායකවරයාට ය.
(2) අගමැතිවරයාට ය.
(3) ජනාධිපතිවරයාට ය.
(4) පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ට ය.

(32) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර මින් කුමක් ද?
(1) ජාතික රාජ සභාව / නාමික විධායක / ජනමත විචාරණය
(2) ජාතික රාජ සභාව / විධායක ජනාධිපති / අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(3) මූලික අයිතිවාසිකම් / විධායක ජනාධිපති / අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(4) විධායක ජනාධිපති / සමානුපාතික නියෝජන ක්‍රමය / ජනමත විචාරණය

(33) දකුණු ආසියානු කලාපීය වරණාත්මක වෙළෙඳ ගිවිසුම හැඳින්විය හැකි කෙටි නම පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) සප්තා (2) සාර්ක් (3) නෆ්තා (4) ආසියාන්

(34) ලංකාවේ ප්‍රථමයෙන් පිහිට වූ මහනගරසභා තුන ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කොළඹ ,ගම්පහ, කළුතර (2) කොළඹ, මහනුවර, ගාල්ල
(3) කොළඹ , යාපනය , ගාල්ල (4) කොළඹ, මහනුවර, මාතර

(35) සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් දෙපාර්ශයටම මුහුණ පාන්නට සිදුවන පොදු ගැටලුවක් වන්නේ,

(1) අවාසිදායක වෙළෙඳ ශේෂය (2) දේශපාලන අස්ථාවර බව
(3) පරිසර දූෂණය (4) බලශක්ති අර්බුදය

(36) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සංක්‍රමණයන් පහත පිළිතුරුවලින් තෝරන්න.

(1) භද්දකච්චානා ඇතුළු පිරිස පැමිණීම (2) පණ්ඩු පාරින්ද ඇතුළු පිරිසගේ පැමිණීම
(3) සේන හා ගුත්තිකගේ පැමිණීම (4) කාලිංග මාඝගේ පැමිණීම

(37) පළාත් සභා මැතිවරණයක දී ඡන්ද කොට්ඨාස ලෙස සලකනු ලබන්නේ කවර පරිපාලන ඒකකයක් ද?

(1) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය (2) පළාත
(3) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (4) දිස්ත්‍රික්කය

(38) පහත "අ" තීරුවේ සඳහන් ප්‍රකාශ "ආ" තීරුවේ සඳහන් ප්‍රකාශ සමඟ ගැළපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. ඛනිජ තෙල් මිල පාලනය | A ලෝක බැංකුව |
| 2. ලෝක සාමය ආරක්ෂා කිරීම | B යුනිසෙෆ් |
| 3. ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම | C ඔපෙක් සංවිධානය |
| 4. විදේශ ආධාර සැපයීම | D එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| | E ගැට් සංවිධානය |

(1) EDBA (2) CDBA (3) BCED (4) CDAE

(39) ශ්‍රී ලංකාවට ක්‍රමවත් අධිකරණ පද්ධතියක් හඳුන්වා දුන්නේ,

(1) පෘතුගීසීන් විසිනි. (2) ප්‍රංශ ජාතිකයන් විසිනි.
(3) ලන්දේසීන් විසිනි. (4) ඉංග්‍රීසීන් විසිනි.

(40) පහත දැක්වෙන කරුණු අතුරින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු වශයෙන් ඉටුකළ යුතු නීතිමය යුතුකම් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - දෙමව්පියන්ට සැලකීම
B - පොදු දේපළ සුරක්ෂිත කිරීම
C - ගුරුවරුන්ට සැලකීම
D - අයබදු ගෙවීම

(1) A හා C (2) A හා B (3) B හා C (4) B හා D



14076

1 ∧ 0 ˀ ˀ
සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

7 - 11 - 2016

Library

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(ii) දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් සඳහන් කරන්න.

(iii) යුක්තිය යනු අපක්ෂපාතීව කටයුතු කිරීමයි. ඒ තුළ අන්තර්ගත ප්‍රධාන කරුණු දෙක නම් කරන්න.

(iv) රාජ්‍යයක ප්‍රධාන අංග දෙකක් නම් කරන්න.

(v) ශ්‍රී ලංකාව හැර සාර්ක් සංවිධානයට අයත් රටවල් දෙකක් නම් කරන්න.

(vi) නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.

(vii) තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම නිසා සිදුවන වාසි දෙකක් ලියන්න.

(viii) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත්විඳීමට සිදුවී ඇති සෘණාත්මක බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(ix) ගැටුම් ඇති වීමට බලපාන සමාජමය මූල දෙකක් නම් කරන්න.

(x) ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20)

(02) ජනතාව විසින් ජනතාව උදෙසා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.

(i) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දක්නට ලැබෙන අංග ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ආණ්ඩුවේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) රටක ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියෙක් ලෙස අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත් වෙයි.

(i) බහු සංස්කෘතික ජන සමාජයක ජීවත්වන පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) යහපාලනයක මූලික ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක සමාජිකයින් ලෙස එක්සත්ව ජීවත්වීමෙන් රටකට අත්වන ප්‍රතිලාභ තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) පුරවැසි අවශ්‍යතා උපරිම අයුරින් ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක ප්‍රධානතම වගකීමයි.

(i) පහත දේශපාලන වෙනස්කම් සිදු කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ A, B අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව ඇති කිරීම

B - ජාතික රාජ සභාව ඇති කිරීම (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස පරිසර කළමනාකරණයට දායක විය හැකි ආකාර තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) තිරසාර සංවර්ධනය උදෙසා පරිසරය සුරැකීමේ වැදගත්කම හඳුනාගනියි.

(i) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජලය දූෂණය මගින් ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණපාන ගැටලු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) මානව අයිතිවාසිකම් භුක්ති විඳිමින් මානව හිතවාදී පුරවැසියකු ලෙස කටයුතු කරයි.

(i) පහත A, B, හි සඳහන් අයිතිවාසිකම් සම්බන්ධයෙන් පුරවැසියකු ඉටු කළ යුතු යුතුකම් සඳහන් කරන්න.

A - අධ්‍යාපනය ලැබීමේ අයිතිය

B - සාමකාමීව එක්රැස්වීමේ අයිතිය (ලකුණු 02)

(ii) අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනතට අදාළ ලේඛන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) මානව හිමිකම් සුරැකීමෙහි ලා පුරවැසියකු සතු කාර්ය භාරයන් තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) ලෝක සමාජයේ සාමාජිකයෙකු ලෙස ඵලදායීව ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට දායක වෙයි.

(i) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ මණ්ඩලයට අනුබද්ධ ආයතන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ජාත්‍යන්තර සබඳතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිකරන බලපෑම් පහත මාතෘකා ඔස්සේ විස්තර කරන්න.

A- ජාත්‍යන්තර වෙළෙඳාම B - රැකියා සැපයීම (ලකුණු 05)